# 2. දේව මැවිල්ලේ මහිමය

**මුළු මැවිල්ලෙහි නිර්මාතෘ සර්වබලධාරී එකම දෙවියන් වහන්සේ බව පෙර පාඩමෙන් අපි පැහැදිලි ව අවබෝධ කර ගත්තෙමු. ඒ සඳහා අපට මග පෙන්වූයේ ශුද්ධ බයිබලය යි. එම සත්‍යය නොවෙනස් ව පවතී.**

**මුළු මහත් මැවිල්ල හා අපගේ ජීවිත නිර්මාණය කළ දෙවියන් වහන්සේ අපට ඇති ආදරය නිසා අපට ජීවත් වීමට අවශ්‍ය සියල්ල ම මැවිල්ල තුළින් ම සපයා දුන් බව ඔබ දන්නවා ද? අප අද ශුද්ධ බයිබලයෙන් ම සොයන්නට යන්නේ දෙවියන් වහන්සේ අපගේ සැපයුම්කරුවාණෝ ද වන බව ය.**




හිමිදිරියේ සූර්යයා නැග එනවිට අපගේ ජීවිතවලට අලුත් දවසක් උදා වේ. හිරු එළිය වැටෙන විට, අපි දවසේ වැඩ කටයුතු ආරම්භ කරමු. සූර්ය රශ්මියෙන් නික්මෙන ශක්තිය ගස්වැල්වල පැවැත්මට අත්‍යවශ්‍ය ය. සූර්ය තාපයෙන් විදුලිය නිපදවීමට පවා බුද්ධිය ලත් මිනිසා සමත් වී ඇත. ඉර එළිය බැස යාමත් සමග දවසේ වැඩ කටයුතු නිමවා, අපි රාත්‍රි කාලයේ නින්දේ දී විවේක සුවය ලබමු.

අප ගැන සලකන දෙවියන් වහන්සේ රාත්‍රිය ආලෝකවත් කිරීමට චන්ද්‍රයා අහසෙහි බැබළවූ සේක. එ මගින් රාත්‍රියේ, සාගරයේ සැරිසරන නාවිකයන්ට හා ධීවරයන්ට මග පෙන්වීම ලැබේ. චන්ද්‍රයාගේ බලපෑම තුළ සාගර ජලයේ වඩදිය, බාදිය ඇති වේ. විශේෂ කාල වකවානු තීරණය කිරීමට ද චන්ද්‍රයා උපයෝගී කරගනු ලැබේ. චන්ද්‍රයාගේ ආලෝකය

පමණක් නොව රාත්‍රී කාලයේ අහසේ දිදුළන තාරකා රටා අපට එළි දක්වන්නේ සුන්දර දර්ශනයකි. තාරකාවන්ගේ පිහිටීම අනුව සාගර තරණයේ දී දිශාවන් ගැන දැනුවත් විය හැකි ය. **දෙවිඳාණෝ සියලු ම ආකාශ වස්තූන් මැව්වේ මිනිසාගේ යහපත සඳහා ය. මේ අනුව මැවුම්කරුවාණන්ගේ සැපයීම ඉතා අගනේ ය.**



2.1 රූපය - දේව මැවිල්ල -ඉර, සඳ, තාරකා

මැවිල්ල තුළ අපට ජීවත් වන්නට ජලය අත්‍යවශ්‍ය වේ. ජලය නොමැති ව කිසිම දෙයක පැවැත්මක් නැත. කඳු මුදුන්වලින් රිද්මයකට ගලා බසින දිය ඇළි, ගංගා, ඇළදොළ, සාගර, මුහුදු, අපට සපයා දුන්නේ දෙවියන් වහන්සේ යි. උන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන්නේ අප මේ සම්පත් ප්‍රයෝජනයට ගන්නා අතරම ඒවා රැක ගැනීම යි. මැවිල්ල අලංකාර කිරීමට විවිධ වර්ගයේ වෘක්ෂලතා මැවූ දෙවියන් වහන්සේ ඒ මගින් අපට පෝෂණය සුවය හා සෙවන ද සලසන සේක. ඒවා වර්ධනය කරමින් නිරන්තරයෙන් අපට අවශ්‍ය බොහෝ දෑ සපයා දෙන සේක. පෙර පාඩමේ අප කියැවූ **උත්පත්ති 1:11-12,** ඔබට මතක ද?



2.2 රූපය - දේව මැවිල්ල.

බීජ උපදවන ඇට සහිත එල දරන සියලු වර්ගවල ගස් කොළන් මවා ඒවා වැඩී එල දැරීමට දෙවියන් වහන්සේ  සැලසූ සේක. අප භුක්ති විඳින එම ඵලදාව, උන්වහන්සේගේ සැපයුම යි. අපට **පෝෂණය** ලබා දෙන ගොයම, කොස්, දෙල්, පොල් මැවුම්කරුවාණන්ගේ සැපයුම යි. අපේ රටේ වැඩෙන ඉරමුසු, පොල්පලා, වෙනිවැල්ගැට වැනි **ඖෂධීය** පැළෑටි, අප සුවසෙත සඳහා සපයා ඇත්තේ, සැපයුම්කරුවාණෝ ය. අප රස බලන්නට ප්‍රිය කරන, රඹුටන්, මසං, නාරං, අඹ, වෙරළු, උගුරැස්සා වැනි **පළතුරු** උන්වහන්සේගේ  අගනා සැපයීම් වේ. අපගේ නිවෙස්වලට අවශ්‍ය **ගෘහ භාණ්ඩ** සාදා ගැනීමට තේක්ක, කළුවර, බුරුත, නැඳුන් වැනි විශාල වෘක්ෂ උන්වහන්සේ සැපයූ සේක. මේ විශාල ගස් එක්වරම ලොකු ගස් වන්නේ නැත. කුඩා බීජයකින් විශාල ගසක් බවට ක්‍රමයෙන් වර්ධනය කිරීමේ ක්‍රියාවලිය කරනුයේ දෙවියන් වහන්සේ යි.



2.3 රූපය - දේව මැවිල්ල.

පරිසරය සරසන, අපගේ ජීවිතවල ප්‍රසන්න හැඟීම් පුබුදු කරවන ලස්සන පාටැති, සුවඳ විහිදුවන මල්, කොපමණ ප්‍රියංකර ද? එහා මෙහා පියාසර කරන පක්ෂීන්, සමනලුන්, මී මැස්සන්, ඒ වගේ ම සිවුපාවුන්, මිනිස් ජීවිතයට ලබා දෙන  තෘප්තිය වචනවලින් විස්තර කළ නොහැක. මේ සියල්ල අපට සපයා දෙමින් ස්වභාව ධර්මය අපගේ ජීවිතවලට සමීප කළේ දෙවියන් වහන්සේ ය. එමෙන් ම අලි ඇතුන්, ඔටුවන්, අශ්වයන්, ගවයන් වැනි සිවුපාවුන් අපගේ අවශ්‍යතාවන්ට සහාය වීමටත් මැවිල්ලේ අසිරිය පූර්ණ කිරීමට පොහොසත් වී ඇත. එපමණක් නොවේ ආදරය, කරුණාව කළගුණ සැලකීම, ආරක්ෂාව වැනි **උතුම් ගතිගුණ** ද සහිත සත්ත්ව ලෝකයේ ආදර්ශ ද අපට ලබා ගත හැකි ය.

 

2.4 රූපය - දේව මැවිල්ල.

මුළු මැවිල්ලේ මැවුම්කරුවාණන් වහන්සේ සැපයුම්කරුවාණන් ලෙස අපගේ අවශ්‍යතා සපුරා ගැනීමටත් අපගේ ජීවිතවලට වැඩි වටිනාකමක් දීමටත් මේ සියල්ල සපයා දුන් සේක. ඒවා ආරක්ෂා කරමින් භුක්ති විඳීම අපගේ වගකීම වේ. මේ සියල්ලේ සැපයීම තුළින් උන්වහන්සේගේ මහිමය ප්‍රකාශ වේ.

**සිතා බලන්න.**

**සමිඳාණෝ යහපත් ය.**
**එතුමන්ගේ ප්‍රේමය ස්ථිර ය.**
**සදහට ම පවත්නේ ය.**
**පරපුරෙන් පරපුරට එතුමන්ගේ විශ්වාසවන්ත කම**
**පවත්නේ ය.**

**ගීතාවලිය 100 : 5**

**කටපාඩම් කරමු.**
**ජෝබ් 36 :27-28**

ක්‍රියාකාරකම:

1. අප රස විඳින බත් පිඟාන ඔබ අතට පත්වීමට පෙර ඒ වෙනුවෙන් දායක වන විවිධ ක්ෂේත්‍ර හා පුද්ගලයන් පිළිවෙළින් ලියා දක්වන්න.

2. මුළු මැවිල්ලේ මැවුම්කරුවාණෝ හා සැපයුම්කරුවාණෝ දෙවියන් වහන්සේ ය. එම මැවිල්ලේ අපගේ අවශ්‍යතා ඉටුකර දෙන 1. ශාක 2. සත්ත්ව 3. මිනිස් සේවාවන් වර්ගීකරණය කරන්න.